# නොමියෙන මහ ගත්කරු - ජයතිලක







***අභාවප්‍රාප්ත කේ. ජයතිලක මහතා***

**සි**ංහල සාහිත්‍යයේ උන්නතිය උදෙසා අප්‍රමාණ මෙහෙයක් ඉටු කළ මහා ලේඛක කේ. ජයතිලක ශූරීහු ඉකුත් මස 14 වෙනි දින මෙලොව හැර ගියහ. ගම්පහ දිස්ත්‍රික්කයේ කන්නිමහර දී 1926 ජුනිමස 27 වෙනි දින උපත ලද එතුමෝ මියෙන විට 86 වියට පා තබා සිටියහ. ආදාහනය ගිය මස 18 වන දින කිරිදිවැල එතුමා උපන් ගමේදී විශාල ජනකායක් අබියසදී සිදු කරන ලදී

ජයතිලක මහතාගේ ලේඛක ජීවිතයේ ගැඹුරුබව එතුමන් අතින් රචනාවූ කෘතීන් කෙරෙන් මොනවට විද්‍යාමාන වෙයි. නව කතා 16 ක්, කෙටිකතා 8 ක් සහ විචාර ග්‍රන්ථ 9 ක් පමණක් නොව ළමා පොත් සහ වේදිකා නාට්‍ය රචනාවෝද ඒ අතර වෙති. මහගම සේකර සමග එක්ව කේ ජයතිලකයන් කළ 'ව්‍යංගා' නම් කාව්‍ය සංග්‍රහයක් ද වෙයි.

වර්තමාන ශ්‍රීලංකාවේ විසූ දැවැන්ත සහ වෘත්තීය මට්ටමේ සිටි එකම ලේඛකයාද ඔහු යයි මහාචාර්ය සෝමරත්න බාලසූරිය පවසයි. එසේම නවකතා කරණයේදී හෝ සාහිත්‍ය විචාරයේදී හෝ ජයතිලකයන් බටහිර හෝ වෙනත් කිසිදු මත වාදයකට ගැති නොවී තමාම සකසා ගත් නිවහල් චින්තනයකට අනුව කටයුතු කළේයයි ද ඔහු කියයි.

ජයතිලකයන් අතිශය බුද්ධිමත් ලේඛකයෙකු බව පැවසූ අය අතර අද අප අතර නැති මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයෝ ද වෙති. ජයතිලකයන්ගේ ප්‍රථම නවකතාව වන **පරාජිතයෝ** කියවූ ඔහු වසර ගණනකට පෙර පැවසුවේ මෙලෙසිනි.

"මගේ වැටහීමට අනුව කේ. ජයතිලක අද ඉහළම තලයේ සිටින නිර්මාණාත්මක ලේඛකයන් හා බුද්ධිමතුන් අතරෙහි ලා ගිණිය හැකිවෙයි. ප්‍රමුඛත්වය අතින් ඔහු දෙවෙනි වෙතොත් ඒ මාර්ටින් වික්‍රමසිංහට පමණි."

පුංචි රාළගේ මරණය, රාජපක්ෂ වළව්ව, මතු සම්බන්ධයි, මායා මාලිගා, කාලො අයං තෙ, චරිත තුනක්, දෙලොවට නැති අය, පරාජිතයෝ, අප්‍රසන්න කතාවක්, පිතාමහ, අර්ධ නවකතාවක්, අධිෂ්ඨාන, පුංචිරාළ, පියා සහ පුත්තු, මහල්ලෙකුගේ ප්‍රේම කතාව ඔහු ලියා ඇති නවකථා ය.

එකගෙයි අවුරුද්ද, නොනිමි සිත්තම, අතීරණය, වජිර පබ්බත, පුනරුත් පත්තිය, කටු සහ මල්, දියණිය ආපසු එයි ජයතිලකයන් ලියා ඇති කෙටිකතා ය.

ඔහුගේ ජීවිතයේ පණස් වසරක මතක සටහන් අලලා 'පුංචි පැළේ ගස වෙනා' නමැති ගන්ථයක් සම්පාදනය කළේය. සැබැවින්ම එය නවකතාවක් පරිදිම රසවත් සිද්ධීන්ගෙන් පිරුණේ වෙයි.

එහි එක් තැනක මෙසේ ලියැවී ඇත.

"අප උපන්නේ දැනට වඩා දීනහැඟීම් පැතිර පැවති ලෝකයකට ය. ප්‍රභූ සුදු පාලකයන් ඉදිරියේ දීනයෝ වූහ. සාමාන්‍ය ජනතාව ප්‍රභූන් ඉදිරියේ දීන ලෙස හැසිරුණාහ. මේ හැඟීම් ළමයින් තුළ පවා පැවතිණ. මුල් ගුරුතුමා පාසැල් පැමිණියේ අභිමානවත් ගොනෙකු බැඳි බක්කි කරත්තයක ය. ඔහුගේ එක් පුතෙක් අපේ පන්තියේ ද විය. පහළ පන්ති කලින් ඇරෙන නිසා ඔහු කැඳවා ගෙනයෑමට වෙනම වැඩකාරයෙක් පැමිණෙයි. නමුත් අපේ පන්තියේ ලොකු ළමයි මේ දරුවාට පයින් ගෙදර යෑමට ඉඩ දෙන්නේ නැත. ඔව්හු මාරුවෙන් මාරුවට ඔහු වඩාගෙන යති."

සාහිත්‍ය කරණයේදී සාහිත්‍යකරුවෙකුගේ පරමාර්ථය කෙබඳු විය යුතුද යන්න අද සහ එදා පමණක් නොව කවදත් ලේඛකයන්ගෙන් අසන ප්‍රශ්නයක් වන අතර ඔව්හු එය විවිධාකාරයෙන් විස්තර කරන්නට මහන්සි ගනිති. කේ. ජයතිලක මහතාගේ අදහස් මෙසේ ය.

"මිනිසා කරන හැම දෙයකම අර්ථය සර්වඥානක බුද්ධියෙන් හැමවිටම දැකිය නොහැකි නමුදු අප හැම දෙයක්ම කිරීමට උත්සාහ කළ යුත්තේ අර්ථයක් ඇතිවන පරිද්දෙනි. මේ නිසා සර්වඥානක ප්‍රයත්නයක් වන සාහිත්‍යයටද කිසියම් පරමාර්ථයක් තිබිය යුතුවෙයි. යමක් අර්ථවත්වන්නේ එයින් කිසියම් ප්‍රයෝජනයක් ඇති කල්හිය. සාහිත්‍ය පරමාර්ථයද එහි උපයෝගීතාව පදනම් කරගෙන පවතී. උපයෝගීතාව පෞද්ගලික හෝ සමාජමය විය හැක. සමාජ උපයෝගීතාව බෙහෝ ඉහළින් සිටී."

ඉහත වදන් සටහන් වනුයේ **සාහිත්‍ය විචාර සටහන්** නමැති ඔහු ලියා ඇති පොතෙහිය. සැබැවින්ම ජයතිලකයන් සිය නිර්මාණ මෙහෙය වූයේ ඒ උතුම් පරමාර්ථය වෙනුවෙනි. ඒ පරමාර්ථ කිසිවෙකුගෙන් ණයට ගත් ඒවා නොවේ. ඔහුගේ ජීවිතයෙන්ද ඔහු ඇසුරු කළ අවට ලෝකයෙන්ද උකහාගත් අත්දැකීම් සම්භාරයයි. ඔහුගේ සියළු නිර්මාණ වලින් ඒ බැව් පැහැදිලි වෙයි.

ජයතිලක ශූරීන්ගේ සංකීර්ණ මනස කොතරම් පිරිසිදු වූවක් ද යන්න **අත්පසුරු** නම් පොතෙහි එන මේ කුඩා කව අපට පෙන්නයි.

**" ඔබ සිටි තැන හුන්**
**ඒ අහිංසක**
**ළදරුවා කෝ ?**
**බියවන්න එපා**
**මා මහලු වන විට**
**ඔහු ඒවි ! "**

**(අත්පසුරු 41 වන කවිය)**

මේ මහා ලේඛකයා නොඑන ගමන් ගිය බව සැබවි. එහෙත් ඔහු තබා ගිය ජයතිලක ලකුණ අනාගත ලාංකික ලේඛකයින්ට නිසි මග පෙන්වන ආලෝක ධාරාවකි.

♦ ***විස්කම් සෙනෙවිරත්න***

Duke's Court Travel

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan Airlines (Cash plus miles offer) | fr £210 | + Taxes + 12000 Airmiles |
| Qatar Airways | fr £233 | + Taxes |
| Kuwait Airways | fr £220 | + Taxes |
| Emirates | fr £410 | + Taxes |
| Etihad Airways | fr £187 | + Taxes |
| Oman Air | fr £199 | + Taxes |
| Jet Airways | fr £155 | + Taxes |

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

204 King Street, London W6 0RA

සුභද ආරාධනා
පූජ්‍ය කෝන්වැවේ අරියරතන හිමියන්ගේ
නවතම කලා නිර්මාණය
තරු එළියක්
ගී පද රචනා සංග්‍රහය
දොරට වැඩීම
2011 ඔක්තෝබර් 15 දින
ප. ව. 3. 00 ට
ලන්ඩන් බෞද්ධ විහාරයේ දී
සාහිත්‍යකාමී - කලාකාමී
ඔබ සැමට ආරාධනා!

ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

Transfer Fees From only £5

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · HSBC · සම්පත් බැංකුව SampathBank · PEOPLE'S BANK · Standard Chartered · Strong. Safe. Reliable. MCG Mike Cooke Group දින 7ම විවෘතයි

www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

